**2025 වර්ෂය සඳහා වෙළඳපල මිල සැදැහුම් (Shopping Method) යටතේ සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිකිරීම සඳහා පොදු උපදෙස් හා කොන්දේසි**

**නාගරික සංවර්ධන අධිකාරිය**

1. 2025 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත වෙළඳපල මිල සැදැහුම් (shopping Method) යටතේ භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් සහ ඊට අදාළ ලියකියවිලි, නාගරික සංවර්ධන අධිකාරියේ "වෙබ්"අඩවිය හරහා 2024.10.01 දින සිට 2024.10.31 වන දින දක්වා කාලය තුල අයකිරීමකින් තොරව ලබාගත හැකිය.(Download).

2. සැමවිටම නිවැරදි තොරතුරු පමණක් සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ තොරතුරක් සාවද්‍ය බවට හෝ කවර හෝ වැදගත් තොරතුරක් ලබාදීමෙන් වැලකී සිටින බවට පෙනීයන්නේනම් එවැනි අයදුම්කරුවකු ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබනු ඇත. අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. අයදුම්පතට ඇමිණිය යුතු සියලු ලිපි ලේඛන අනුක්‍රමිකව අංකනය කළ යුතුය. මුළු පිටු සංඛ්‍යාව ප්‍රධාන අයදුම්පතෙහි දකුණු පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කලයුතුය.

**අයදුම්පත සමග අමුණා එවිය යුතු ලිපිලේඛණ පහත සඳහන්වේ.**

**අ. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ/සමාගම් ලියාපදිංචිකිරීමේ සහතිකයේ පිටපතක්**

ආ.. සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් වැඩ සඳහා **ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කුමන විශේෂිත කාණ්ඩයක්/ශ්‍රේණියක් යටතේ අවසන්වරට ලියාපදිංචිවී ඇතිද යන්න තහවුරුකිරීම සඳහා එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.**

ඇ. **ලියාපදිංචිවීම සඳහා අයිතම ගාස්තු ගෙවනලද මුදල් තැන්පතු පත්‍රිකාවේ/කුවිතාන්සියේ මුල් පිටපත අනිවාර්යයෙන් ඇමිණිය යුතුය.**

**ඈ. ලියාපදිංචිවී ඇති පුද්ගලයන් "වැට්"බදුසහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතු වේ.**

4. විධිමත් පරිදි සම්පූර්ණ කරනලද අයදුම්පත් අවශ්‍ය සියලු ලිපිලේඛන සහිතව ආවරණ ලිපියක් මගින් පහත සඳහන් ලිපිනයට **2024.11.30** දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල මගින් හෝ ගෙනවිත් භාරදිය යුතුය.අයදුම්කරුවන් විසින් අයදුම්පත් බහාලු ලියුම්කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025"** යනුවෙන් සඳහන් කල යුතුය.

**සභාපති**
**නාගරික සංවර්ධන අධිකාරිය,**
**ප්‍රසම්පාදන ඒකකය,**
**7** වන මහල,
**"සෙත්සිරිපාය"**
**බත්තරමුල්ල.**

**අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්**

5. ප්‍රශ්නයක් ඉදිරියෙහි ඊට උචිත ආකාරයට "ඔව්"/"නැත" යන්න, පැහැරහැරීමකින් තොරව කපා දමන්න.

6. කරුණාකර අයදුම්කරුට අදාළ නොවන කවර හෝ අයිතමයක් ඉදිරියෙන් "අ/නො" (අදාළ නොවේ) යන්න සඳහන් කරන්න.

7. ලියාපදිංචිකිරීමෙන් පසුව යම් සමාගමක/ආයතනයක තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදුවුවහොත්, එම ඉල්ලීම සලකා බලනු ලබනුයේ එම ඉල්ලීම සමග එකී සංශෝධනයට සම්බන්ධ අදාළ සමාගම/ ආයතනය මගින් නිකුත් කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණි.

8. ***ලියාපදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ හෝ අයිතම වර්ගයෙහි කිසිදු වෙනසක් සිදුකල නොහැකි බව හා අයිතම අතර මාරුකිරීම්ද සිදුනොකරන බව සලකන්න.***


9. **අයදුම්කරුගේ යම් ප්‍රමාද දෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වගකීම භාරගනු නොලැබේ.**

10. **එක් අයිතමයක් සඳහා ලියාපදිංචිකිරීමේ ගාස්තු වශයෙන් රු. 1,200.00 මුදලක් අයකරනු ලැබේ. (2.5% (සමාජ ආරක්ෂන බද්ධ) සහ 18% (එකතු කල අගය මත බද්ධ)ඇතුළුව)**

**එක් අයදුම්කරුවෙකුට අයිතම කිහිපයක් සඳහා ඉල්ලුම් කල හැක. අයිතම ලියාපදිංචි කිරීමේ ගාස්තු ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ අංක 1534 දරණ ගිණුමට බැර වන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම හෝ නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලය, පළාත්/දිස්ත්‍රික් කාර්යාලයකට ගෙවීම කල හැක.**

**සැ.යු. - අයිතමයක් ලෙස සලකණු ලබන්නේ අයිතම ලැයිස්තුවෙහි (Item List) එක් ඉංග්‍රීසි අකුරක් සමඟ ඉලක්කමක් යටතේ දක්වා ඇති අයිතමයක් වේ. (උදා: A1 එක් අයිතමයකි,A2 එක් අයිතමයකි, A3 එක් අයිතමයකි ආදී වශයෙන්)**

11. අයිතම ගාස්තු අදාළ ලංකා බැංකු ශාඛාව හරහා ගෙවන්නේනම්, අයදුම්කරුවන් විසින් පහත සඳහන් අකෘතිය ආකාරයට **මුදල් තැන්පතු පත්‍රිකාව** පුරවා, එම ගාස්තු අදාළ බැංකු ශාඛාව වෙත ගෙවිය යුතුවේ.අයිතම ගාස්තු නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලය,පළාත්/දිස්ත්‍රික් කාර්යාලයකට ගෙවන්නේනම් අයදුම්කරුවන් විසින් එම ගාස්තු ගෙවීමෙන් පසු ප්‍රධාන කාර්යාලය, අදාළපළාත්/දිස්ත්‍රික් කාර්යාලය විසින් නිකුත් කරන කුවිතාන්සිය ලබාගත යුතුවේ.


BANK OF CEYLON
Bankers to the Nation
මුදල් තැන්පතු පත්‍රිකාව பண வைப்புச் சீட்டு Cash Deposit Slip
දිනය / திகதி / Date 1 5 1 1 2 0 1 6
ගිණුම්/කාඩ්පත් අංකය கணக்கு/அட்டை இலக்கம் Account/Card Number 1 5 3 4
ගිණුම්/කාඩ්පත් හිමියාගේ නම සහ ලිපිනය : නාගරික සංවර්ධන අධිකාරිය
கணக்கு/அட்டை வைத்திருப்பவரின் பெயரும் முகவரியும் : 6 සහ 7 මහල
Account/Card Holder's Name and Address : "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

ගිණුම්/කාඩ්පත් හිමියා නොමැතිව වෙනත් පාර්ශවයක් විසින් කරන රු: 200,000ට වැඩි මුදල් තැන්පතු සඳහා
கணக்குரிமையாளர்/அட்டை வைத்திருப்பவர் அல்லாது மற்றவர்கள் ரூபா.200,000/-க்கு மேல் பணவைப்புச் செய்பவை
For cash deposits above Rs. 200,000 deposited by Person other than A/C Holder/Card Holder

තැන්පතු කරන්නාගේ නම සහ ලිපිනය / வைப்புச் செய்பவரின் பெயரும் முகவரியும் Depositor's Name and Address
ඒ.බී.සී. සමාගම
ගාලු පාර, කොළඹ 03.
ජා.හැ.ප/ගමන් බලපත් / රියදුරු බලපත් අංකය
தே.அ.அ/கடவுச்சீட்டு/சாரதி அனுமதிப்பத்திர இல./N.I.C / P. P / D. L No.:
දුරකථන අංකය / தொலைபேசி இல./ Telephone No:
තැන්පතුවේ අවශ්‍යතාවය / வைப்பின் நோக்கம் / Purpose of Deposit: සැපයුම්කරුවන් ලියාපදිංචිය 2017
Ref No.
තැන්පත්කරුගේ අත්සන / வைப்புச்செய்பவரின் ஒப்பம் / Depositor's Signature
පරිගණක මුද්‍රාව හෝ බලය පත්‍රත් අත්සන් වලංගුයි / கணனி அச்சீடு அல்லது அதிகார ஒப்பம் இருப்பின் செல்லுபடியாகும்/Valid Computer Print or Authorised Signature

| නෝට්ටු தாள்கள் Notes | රුපියල් / ரூபா / Rs. | | | ශත சதம் Cts. |
|---|---|---|---|---|
| 5000/- | | | | |
| 2000/- | | | | |
| 1000/- | | | | |
| 500/- | | | | |
| 200/- | | | | |
| 100/- | | | | |
| 50/- | | | | |
| 20/- | | | | |
| 10/- | | | | |
| කාසි குத்திகள் Coins | | | | |
| එකතුව மொத்தம் Total | | 1 | 200 | 00 |

UDAYA GRAPHICS - TEL 2519401-3
Validation checked

Signature

12. **2025** වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ වැඩිදුර තොරතුරු අවශ්‍ය වුවහොත් පහත සඳහන් නිලධාරී අමතන්න.(කාර්යාල වේලාවන් තුළ පමණි)

- සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) - නාගරික සංවර්ධන අධිකාරිය

  දුරකථන අංක–**011 3049008**

| | | | |
|---|---|---|---|
| **011 2875916-20** | **011 2873651-2** | **011 2873644** | දිගුව - **2681** |
| **011 2873647** | **011 2873649** | **011 2875333** | |
| **011 2797200** | | | |

- සහකාර අධ්‍යක්ෂ (මුදල්) - නාගරික සංවර්ධන අධිකාරිය - දිගුව - **2683**

13. **සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය** විසින් පත්කරනු ලබන නිලධාරියෙකු විසින් සියලු අයදුම්පත් සලකා බලන අතර, අවශ්‍ය සුදුසුකම් සපුරනලද අයදුම්කරුවන් පමණක් ලියාපදිංචි කෙරේ. අවශ්‍ය සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණකොට නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. **2024** වර්ෂය සඳහා භාණ්ඩ, වැඩ සහ සේවා මිලදී ගැනීම සඳහා භාවිතා කරන ලද සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි ලේඛණය, **2025** වර්ෂයට අදාළ **සැපයුම්කරුවන්ගේ/කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛණය නිකුත් කල පසු අවලංගු වේ.**

15. **2025** වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය **සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ.**

**සභාපති**
**නාගරික සංවර්ධන අධිකාරිය**
**ග්‍රාමීය හා නාගරික සංවර්ධන,**
**නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය**

**නාගරික සංවර්ධන අධිකාරිය**
ප්‍රසම්පාදන ඒකකය,
7 මහල,
"සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

2024 ඔක්තෝම්බර් මස 01